## මහජනතාව වෙත කරනු ලබන දැනුම් දීමයි

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

# පිරමීඩ යෝජනා ක්‍රම නීති විරෝධී වෙයි!

පිරමීඩ යෝජනා ක්‍රම "පහසුවෙන් මුදල් උපයා ගැනීමට" හෝ "අන්තර් ජාලය ඔස්සේ භාණ්ඩ හා අතථ්‍ය මුදල් වෙළඳාම් කිරීමෙන්" ඉතා ඉක්මණින් කිසිදු පරිශ්‍රමයකින් තොරව මුදල් උපයා ගත හැකි බව දන්වමින් ක්‍රියාත්මක වේ.

පිරමීඩ යෝජනා ක්‍රම ශ්‍රී ලංකා නීතිය යටතේ නීති විරෝධී ක්‍රියාවන් බව මහජනතාවට අනතුරු අඟවා සිටිමු.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ව්‍යාපාර කිහිපයක් පිරමීඩ යෝජනා ක්‍රම බවට හදුනාගෙන ඒ පිළිබඳව මාධ්‍ය මගින් මහජනතාව දැනුවත් කර ඇත. මෙම පල කරන ලද ලැයිස්තුව සම්පූර්ණ ලැයිස්තුවක් නොවන අතර තව සමහරක් යෝජනා ක්‍රම පිළිබඳව විමර්ෂණ කටයුතු කරගෙන යනු ලබන බව නමුත් ශ්‍රී ලංකා මහ බැංකුව අවධාරණය කර සිටියි.

සමහර පිරමීඩාකාර යෝජනා ක්‍රම ප්‍රවර්ධනය කරන්නන් විසින් ඔවුන්ගේ යෝජනා ක්‍රම වලට ප්‍රසිද්ධිය ලබා දීම සදහා හා නව සාමාජිකයින් බඳවා ගැනීමට ජනප්‍රිය ක්‍රීඩා හා ආගමික උත්සවයන් යොදා ගනී. මීට අමතරව ප්‍රවර්ධන කේත හා සංවිධාන කේත ලබා දීම මඟින් නව සාමාජිකයින් ඇතුලත් කර ගැනීමේ ප්‍රවණතාවයක් ඇත.

ඒ අනුව, මහජනතාවට මෙවැනි පිරමීඩ යෝජනා ක්‍රම පිළිබඳව අවධානයෙන් සිටීමට උපදෙස් ලබා දෙන අතර පිරමීඩ යෝජනා ක්‍රම වලට ඍජුව හෝ වක්‍රව සම්බන්ධවීම නීතිය ඉදිරියේ දඬුවම් ලැබිය හැකි වරදක් බවට දන්වා සිටිනු ලැබේ.

**ශ්‍රී ලංකා මහ බැංකුව, අංක 30, ජනාධිපති මාවත, කොළඹ 01**
☎ (Hotline) 1935 / +94 11-2477966